# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

**අංක 13,066 — 1962 මැයි 4 වැනි සිකුරාද — 1962.5.4**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)


# I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි, සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට |
|---|---|
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන ප්‍රකාශන ආදිය ... ... | — |
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත්කිරීම් ආදිය ... | 671 |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත්කිරීම් ආදිය ... | 671 |
| අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත්කිරීම් ආදිය | 672 |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... | 673 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... | 674 |
| ආණ්ඩුවේ නිවේදන ... ... ... | 674 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහා බැංකුවේ දැන්වීම් ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... | — |
| ආණ්ඩුවේ වත්කම් හා බැරකම් ප්‍රකාශ ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... | 675 |
| "සුරාබදු ආඥාපනත" පිළිබඳ දැන්වීම් ... ... | — |


## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත්කිරීම් ආදිය

**1962 අංක 170**

අංකය : ඕ 42/රෙක්ට්.

**නිලධාරීන් පත්කිරීම්—රාජකීය ලංකා නාවික හමුදාව**

අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් රාජකීය ලංකා නාවික හමුදාවේ පහත සඳහන් පත්කිරීම් අනුමත කර තිබේ :—

1962 මාර්තු මස 26 වැනි දින සිට රා. ව. ලං. තිස්ස නෞකාවේ අණදෙන නිලධාරි තැන වශයෙන්—

ලයිතන් කොමාන්ඩර් ඩී. සී. ඉංගල්ටන්, රා. ලං. නා. හ.

1962 අප්‍රේල් මස 1 වැනි දින සිට රා. ව. ලං. කොටියා නෞකාවේ අණදෙන නිලධාරි තැන වශයෙන්—

ලයිතන් ඒ. එච්. ඒ. ද සිල්වා, රා. ලං. නා. හ.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ඇන්. කෲ. දියෙස්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1962 අප්‍රේල් 25 වැනිදා,
කොළඹ දීය.

5-132

## රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත්කිරීම් ආදිය

**1962 අංක 171**

රාජ්‍ය සේවා කොමිෂන් සභාව පහත සඳහන් පත්කිරීම් කරන ලෙස නියම කර ඇත්තේ ය :—

**ඒ. 132/62.**

1962 අප්‍රියෙල් මස 12 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු අධිකරණ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් ජී. පී. ඒ. සිල්වා මහතා අල්ලස් කොමසාරිස් වශයෙන් වැඩ බැලීමට.

**ඒ. 245/61.**

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ උද්භිද රෝග නිදානඥ ආචාර්ය ජේ. ඩබ්ලිව්. ඇල්. පීරිස් මහතා 1961 දෙසැම්බර් මස 16 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු එම දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ) තනතුරේ වැඩ බැලීමට.

**ඒ. 322/60.**

1961 දෙසැම්බර් මස 16 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු සී. ආර්. කරුණාරත්න මහතා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ තාවකාලිකව නියෝජ්‍ය අධ්‍යක්ෂ (කෘෂිකර්ම) වශයෙන්.

**සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.**

**ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 3.30 ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3.30 ට ප්‍රථමයෙන්).**

**ගැසට් පත්‍රය ලබාගැනීම සඳහා දායකමුදල් කොළඹ, මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙලින්ම යැවිය යුතුය. ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දායකමුදල් භාරගනු නොලැබේ.**

ඒ. 78/62.

පී. ඊ. වීරමන් මහතා 1962 මාර්තු මස 19 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු සංස්කෘතික කටයුතු පිළිබඳ අධ්‍යක්‍ෂක වශයෙන් වැඩ බැලීමට.

ඒ. 54/61.

1961 නොවැම්බර් මස 24 වැනි දින සිට 1961 දෙසැම්බර් මස 16 වැනි දින දක්වා අධිනීතිඥ ආර්. අයි. ඔබේසේකර මහතා ඇටෝර්නි ජනරාල් දෙපාර්තමේන්තුවේ ආණ්ඩුවේ අධිනීතිඥයෙකු වශයෙන් වැඩ බැලීමට.

සී. ජ. වල්පිට,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1962 අප්‍රියෙල් මස 28 වැනි දින,
කොළඹ 4, ගාලු මුවදොර මහ ලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දීය.
තැ. පෙ. 500,

5-165

---

# අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය

**1962 අංක 172**

අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් පහත සඳහන් පත් කිරීම් කර ඇත්තේ ය :—

අංකය : ජේඒ. 11/48.

ඕ. එල්. ද ක්‍රෙට්සර් මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන්, 1962 අප්‍රේල් 11 වැනි දින සිට, කොළඹ දිස්ත්‍රික් උසාවියේ අංක 8996/එල් දරණ නඩුවේ තීන්දුව දීමට, කොළඹ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඒ. 2/48.

ඒ. ඩී. ජේ. ගුණවර්ධන මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් 1962 අප්‍රේල් 21 වැනි දින සිට, අවිස්සාවේල්ලේ දිස්ත්‍රික් උසාවියේ අංක 7491 සහ 8327 දරණ නඩු ඇහීමට හා තීන්දු දීමට, අවිස්සාවේල්ලේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඒ. 12/48.

එම්. ඒ. එම්. හුසේන් මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් 1962 අප්‍රේල් 21 වැනි දින සිට, කොළඹ මහෙස්ත්‍රාත් උසාවියේ අංක 7854/බී දරණ නඩුව අවසාන වන තුරු ඇහීමට හා තීන්දුව දීමට, කොළඹ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා කොළඹ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑම්. 2/56 (III).

ඒ. ඩබ්ලිව්. ගුණරත්න මහතා 1962 අප්‍රේල් 21 වැනි දින සිට, නැවත නියමයක් කරන තුරු, පානදුරේ මහෙස්ත්‍රාත් ධුරයේ හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයේ හා පානදුරේ, අතිරේක් දිස්ත්‍රික් නඩුකාර ධුරයේ වැඩ බැලීමට.

අංකය : ජේඒ. 19/48.

ඩී. ඊ. ධර්මසේකර මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් 1962 අප්‍රේල් 26 වැනි දින සිට, ගාල්ලේ මහෙස්ත්‍රාත් උසාවියේ අංක 15553 දරණ නඩුව අවසාන වන තුරු ඇහීමට හා තීන්දුව දීමට, ගාල්ලේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා ගාල්ලේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑම්. 2/56 (III).

එම්. එම්. අබ්දුල් කාදර් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එස්. ජේ. එම්. ජී. එස්. මුදන්නායක මහතා 1962 අප්‍රේල් 15 වැනි දින සිට 29 වැනි දින දක්වා, ත්‍රිකුණාමලේ දිස්ත්‍රික් නඩුකාර ධුරයේ, ත්‍රිකුණාමලේ රික්වැස්ට් කොමසාරිස් ධුරයේ හා මහෙස්ත්‍රාත් ධුරයේ වැඩ බැලීමට හා අනුරාධපුරේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයේ හා අනුරාධපුරේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයේ වැඩ බැලීමට.

අංකය : ජේඑල්. 57ඒ/57.

කේ. ඩී. ඕ. එස්. එම්. සෙනෙවිරත්න මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඒ. එම්. අයි. ගුණරත්න මහතා 1962 අප්‍රේල් 18 වැනි දින සිට 20 වැනි දින දක්වා, ගම්පොල ක්‍රියා කරන පිණිස, මහනුවර, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට හා ගම්පොළ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේඑල්. 68සී/51.

සී. වී. උඩලාගම මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එච්. ඒ. ජයවික්‍රම මහතා 1962 අප්‍රේල් 24 වැනි දින හා 28 වැනි දින සිට 1962 මැයි 2 වැනි දින දක්වා, අනුරාධපුර, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, අනුරාධපුර, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, මන්නාරමේ හා වවුනියාවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, වවුනියාවේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට, ත්‍රිකුණාමලේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට හා ත්‍රිකුණාමලේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට.

අංකය : ජේඑල්. 35බී/61.

ඩී. ඩබ්ලිව්. කේ. ලද්දුවහෙට්ටි මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ජේ. එන්. සී. තිරුචෙල්වම් මහතා 1962 අප්‍රේල් 21 වැනි දින, කොළඹ, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධුරයට හා කොළඹ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට.

අංකය : ජේඑල්. 40ඒ/60.

ඩී. එල්. පී. මූනමලේ මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ජේ. අමරසිංහ මහතා 1962 අප්‍රේල් 19 වැනි දින සිට 21 වැනි දින දක්වා, හම්බන්තොට, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, තංගල්ලේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා තංගල්ලේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 29සී/61.

එම්. ජමීල් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ජේ. එන්. සී. තිරුචෙල්වම් මහතා 1962 අප්‍රේල් 21 වැනි දින, කොළඹ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා කොළඹ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 2ඒ/56.

ඩී. එස්. එල්. පී. අබේසේකර මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, සී. ආර්. ද අල්විස් මහතා 1962 අප්‍රේල් 21 වැනි දින සිට 24 වැනි දින දක්වා, කොළඹ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, කොළඹ, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධුරයට, දෙහිවල-ගල්කිස්සේ, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධුරයට හා කොළඹ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 1ඒ/48.

පී. එස්. ඩබ්ලිව්. අබේවර්ධන මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එන්. කුමාරසාමි මහතා 1962 අප්‍රේල් 30 වැනි දින සිට, 1962 මැයි 3 වැනි දින දක්වා මහනුවර, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, මහනුවර, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධුරයට, දුම්බර, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, මහනුවර අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට හා මාතලේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට.

අංකය : ජේඑල්. 63ඒ/58.

ජේ. ජී. එල්. සුවාරිස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එල්. වී. බී. ද ජැකොලයින් මහතා 1962 අප්‍රේල් 28 වැනි හා 29 වැනි දිනයන්හි, අවිස්සාවේල්ලේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා අවිස්සාවේල්ලේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : පිඑල්/ඒ. 8/61.

ඒ. අලගයියා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එස්. ඒ. සී. එම්. මීරා සායිබු මහතා 1962 අප්‍රේල් 23 වැනි හා 24 වැනි දිනයන්හි, මඩකලපු දිස්ත්‍රික්කයේ, කරවාකු, නින්තාවූර්, සමන්තුරේ හා වැවූගම් පත්තුවල ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පිඒ. මිශ්‍ර/57.

එම්. එම්. පෙරේරා මහතා වෙනත් රාජකාරිවල යෙදී සිටින බැවින් හෝ නැවත නියමයක් කරන තුරු, ඒ. ඩබ්ලිව්. ඒ. ඉමෑනුවෙල් මහතා 1962 මැයි 4 වැනි, 5 වැනි, 9 වැනි, 10 වැනි හා 23 වැනි දිනයන්හි, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දේවමැදි හත්පත්තුවේ ගම්බද උසාවි අතිරේක සභාපති වශයෙන් හා වන්නි හත්පත්තුවේ කටුගම්පල හත්පත්තුවේ සහ හිරියාල හත්පත්තුවේ ගම්බද උසාවි අතිරේක සභාපති ධුරයට.

අංකය : පිඒ. මිශ්‍ර/57.

එම්. ඒ. ඊ. බී. පෙරේරා මහතා 1962 මැයි 2 වැනි දින සිට 5 වැනි දින දක්වා, 7 වැනි දින සිට 12 වැනි දින දක්වා, 14 වැනි දින සිට 17 වැනි දින දක්වා, 21 වැනි දින සිට 26 වැනි දින දක්වා හා 28 වැනි දින සිට 31 වැනි දින දක්වා, හෝ නැවත නියමයක් කරන තුරු, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වන්නි හත්පත්තුවේ ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට හා හිරියාල හත්පත්තුවේ ගම්බද උසාවි අතිරේක සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පිඑල්/එෆ්. 1/56.

ඒ. එල්. එම්. ප්‍රනාන්දු මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එම්. වික්‍රමතුංග මහතා 1962 අප්‍රේල් 23 වැනි දින සිට 25 වැනි දින දක්වා, මාතර දිස්ත්‍රික්කයේ, වැල්ලබොඩ පත්තුවේ, කඩවත් සතරේ සහ වැලිගම් කෝරලේ ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට හා ගඟබොඩ පත්තුවේ අතිරේක සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පිඑල්/පී. 6/51.

එස්. ජී. පීරිස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එම්. වික්‍රමතුංග මහතා 1962 අප්‍රේල් 26 වැනි, 27 වැනි හා 30 වැනි දින සිට 1962 මැයි 2 වැනි හා 3 වැනි දින දක්වා මාතර දිස්ත්‍රික්කයේ, මොරවක් කෝරලේ ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට හා වැලිගම් කෝරලේ හා ගඟබොඩ පත්තුවේ ගම්බද උසාවි අතිරේක සභාපති ධුරයට.

අංකය : පිඑල්/පී. 8/59.

එෆ්. ජී. බී. පෙරේරා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඒ. එල්. එම්. රාජීත් මහතා 1962 මැයි 5 වැනි, 7 වැනි හා 8 වැනි දිනයන්හි, තංගල්ල දිස්ත්‍රික්කයේ, නැගෙනහිර ගිරුවා පත්තුවේ හා මාගම් පත්තුවේ ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පිඑල්/ඩබ්ලිව්. 10/53.

ටී. බී. වැත්තෑව මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඒ. ඩබ්ලිව්. ඒ. ඉමැනුවෙල් මහතා 1962 අප්‍රේල් 24 වැනි හා 26 වැනි දිනයන්හි, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දේවමැදි හත්පත්තුවේ ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට හා වන්නි හත්පත්තුවේ, කටුගම්පොල හත්පත්තුවේ සහ හිරියාල හත්පත්තුවේ ගම්බද උසාවි අතිරේක සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පිඑල්/ඩබ්ලිව්. 10/53.

ටී. බී. වැත්තෑව මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඩී. එස්. විජේසිංහ මහතා 1962 අප්‍රේල් 25 වැනි දින, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දේවමැදි හත්පත්තුවේ ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට හා වන්නි හත්පත්තුවේ, කටුගම්පොල හත්පත්තුවේ සහ හිරියාල හත්පත්තුවේ ගම්බද උසාවි අතිරේක සභාපති ධුරයේ වැඩ බැලීමට.

ඇන්. ඒ. ද ඇස්. විජේසේකර,
අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1962 අප්‍රේල් 26 වැනි දින,
අධිකරණ සේවා කොමිෂන් සභා කායඕලය,
තැ. පෙ. අංකය-573,
කොළඹ-12.

5-77

## වෙනත් පත් කිරීම් ආදිය

### 1962 අංක 173

### ගැසට් නිවේදනයයි

20 වෙනි පරිච්ඡේදය වන ක්‍රිමිනල් නඩුවිධාන සංග්‍රහයේ 120 වෙනි වගන්තිය යටතේ වැඩබලන ගරු අධිකරණ අමාත්‍යවරයා විසින්—

අංක අයිඑන්කහු./එල්/11/8/57.

1962 අප්‍රේල් මස 9 වෙනි දින සිට එස්. අරුලප්ප ඩයස් මහතා නැවත වැඩභාරගන්නා තුරු මන්නාරම් දිස්ත්‍රික්කයේ, මරිච්චුකඩෙයි ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධුරයේ වැඩ බැලීමට ඒ. පරණවාස් ඩයස් මහතාද,

අංක අයිඑන්කහු/එල්. 11/1(1)/61.

1962 අප්‍රේල් මස 4 වෙනි දින සිට එන්. එම්. අහමඩ් ලෙව්වායි මහතා නැවත වැඩභාරගන්නා තුරු මන්නාරම් දිස්ත්‍රික්කයේ උතුරු මුසාලි කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධුරයේ වැඩ බැලීමට එම්. එම්. කාසිම් මහතා ද,

අංක අයිඑන්කහු/එල්/21/3/62.

1962 අප්‍රේල් මස 13 වෙනි දින සිට කේ. එම්. අබේසිංහ මහතා නැවත වැඩ භාරගන්නා තුරු අම්පාරේ දිස්ත්‍රික්කයේ වැවගම් පත්තු ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධුරයේ වැඩබැලීමට පී. එල්. පැට්රික් මහතා ද,

අංක. අයිඑන්කහු/එල්/21/2/62.

1962 අප්‍රේල් මස 12 වෙනි දින සිට කේ. නල්ලෙයිනාතන් මහතා නැවත වැඩ භාරගන්නා තුරු අම්පාරේ දිස්ත්‍රික්කයේ සම්මන්තුරේ කොට්ඨාශයේ හදිසිමරණ පරීක්ෂකධුරයේ වැඩ බැලීමට කේ. සෝමසුන්දරම් මහතා ද,

පත්කර ඇත්තේ ය.

ජී. පී. ඒ. සිල්වා,
අධිකරණ අමාත්‍යාංශයේ වැඩබලන ස්ථිර ලේකම්.

1962 අප්‍රේල් මස 28 වෙනි දින,
කොළඹ අධිකරණ අමාත්‍යාංශයේදීය.

5-131

### 1962 අංක 174

### ගැසට් නිවේදනයයි

අංකය : ජේ 48/59

1944 අංක 13 දරණ ආඥාපණතින් සහ 1948 පෙබරවාරි මස 5 වෙනි දින අංක 9828 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරණ ලද 1948 පෙබරවාරි මස 4 වෙනි දින දරණ ප්‍රකාශනයෙන් සංශෝධිත 1939 අංක 48 දරණ ළමයින් සහ තරුණ අය පිළිබඳ ආඥාපණතේ 3 වෙනි වගන්තිය යටතේ, ගරු අධිකරණ ඇමතිතුමා විසින් :—

1962 අප්‍රේල් මස 21 වෙනි දින සිට, පානදුරේ මහෙස්ත්‍රාත් ධුරය දරණ කාලය තුළ, පානදුරේ අධිකරණ කොට්ඨාශයට ඒ. ඩබ්ලිව්. ගුණරත්න මහතා, ඔහුගේ අනිකුත් රාජකාරි වලට අතිරේක වශයෙන් අතිරේක ළමා උසාවි මහෙස්ත්‍රාත්වරයා ලෙස පත්කර ඇත්තේ ය.

ජී. පී. ඒ. සිල්වා,
අධිකරණ අමාත්‍යාංශයේ වැඩබලන
ස්ථිර ලේකම්.

1962, අප්‍රේල් මස 21 වෙනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දී ය.

5-69

### 1962 අංක 175

### ගැසට් නිවේදනයයි

අංකය : ජේ 83/59

1944 අංක 13 දරණ ආඥාපණතින් සහ 1948 පෙබරවාරි මස 5 වෙනි දින අංක 9828 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරණ ලද 1948 පෙබරවාරි මස 4 වෙනි දින දරණ ප්‍රකාශනයෙන් සංශෝධිත 1939 අංක 48 දරණ ළමයින් සහ තරුණ අය පිළිබඳ ආඥාපණතේ 3 වෙනි වගන්තිය යටතේ, ගරු අධිකරණ ඇමතිතුමා විසින් :—

1962 මැයි මස 9 වෙනි දින සිට 1962 ජූනි මස 9 වනදා වනතුරු හෝ වෙනත් නියෝගයක් නිකුත් කරන තුරු කෑගල්ල අධිකරණ කොට්ඨාශයට ඩී. ඇස්. නෙත්තසිංහ මහතා එම මහතාගේ අනිකුත් රාජකාරිවලට අතිරේක වශයෙන් ළමා උසාවි මහෙස්ත්‍රාත් වරයා ලෙස පත්කර ඇත්තේ ය.

5-40

### 1962 අංක 176

### දැන්වීමයි

එලගුප්පිල්ලෙයි රාමලිංගම් මහතා මාතගල්හි වාසස්ථානය සහ කායඕලයද කිරිමලෙයි අතුරු කායඕලයද ඇතුව යාපනය අධිකරණ කොට්ඨාශය ඇතුළත දෙමල භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් කර්මාන්ත, ස්වදේශ සහ සංස්කෘතික කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් පත්කර තිබේ.

වී. එල්. වීරසිංහ,
කර්මාන්ත, ස්වදේශ සහ සංස්කෘතික කටයුතු
පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්,

1962 ක්වූ අප්‍රියෙල් මස 9 දින,
කොළඹ දී ය.

5-24

1962 අංක 177

**නිවේදනය**

ලංකා සිවිල් සේවාවේ පහත සඳහන් පත්වීම් පහත දක්වා ඇති දින වල පටන් වලංගුවේ:—

අංකය: 74/2/2 (ඇම් ඇප්ජ්.)

ඩබ්. ජේ. ආර්. නවගමුව මහතා, 1962 මාර්තු මස 29 වෙනි දින සිට ප්‍රවාහණ සහ රජයේ වැඩ අමාත්‍යාංශයේ සහකාර ලේකම් වශයෙන් වැඩ බැලීමට.

අංක 74/2/24 (ඇම් ඇප්ජ්.)

ඊ. ජේ. ද සිල්වා මහතා, 1962 අප්‍රේල් මස 2 වෙනි දින සිට රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ සහකාර ලේකම් වශයෙන් වැඩ බැලීමට.

අංක: 74/2/46 (ඇම් ඇප්ජ්.)

ඇම්. ජේ. පෙරේරා මහතා 1962 මාර්තු මස 15 වෙනි දින සිට කර්මාන්ත, ස්වදේශ හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් වශයෙන් වැඩ බැලීමට.

අංක: 74/2/210 (ඇම් ඇප්ජ්.)

ඇල්. අයි. ජේ. සිල්වා මහතා, 1962 මාර්තු මස 9 වෙනි දින සිට ගාල්ල පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්ත වරයාගේ විධානය පිට එකී දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ උප ඒජන්ත වශයෙන් වැඩ බැලීමට.

අංක: 74/2/75 (ඇම් ඇප්ජ්.)

ඞී. නේසයියා මහතා 1962 මාර්තු මස 9. වෙනි දින සිට බදුල්ල පාලන දිස්ත්‍රික්කයේ භාර ආණ්ඩුවේ ඒජන්ත වරයාගේ විධානය පිට එකී දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ උප ඒජන්ත වශයෙන් වැඩ බැලීමට.

අංකය: 74/2/210 (ඇ.ම්. ඇප්ජ්.)

ඒ. ඕ. වීරසිංහ මහතා, 1962 මාර්තු මස 7 වෙනි දින සිට කම්කරු සහ ජනසතු සේවා අමාත්‍යාංශයට අනුයුක්තව සිටීමට.

ඩබ්. ආර්. පී. තිලකරත්න මහතා, 1962 මාර්තු මස 7 වෙනි දින සිට පොලොන්නරුව කච්චේරියට අනුයුක්තව සිටීමට.

හෙ. ජිනදාස,
වැඩබලන භාණ්ඩාගාරයේ ලේකම්.

මුදල් අමාත්‍යාංශය,
කොළඹ.
1962 අප්‍රේල් මස 23 වැනි දින,

5-12

---

## රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත් කිරීම් ආදිය

1962 අංක 178

**රෙජිස්ට්‍රාර් සේවයේ පත්කිරීම්**

පහත නම් සඳහන් නිලධාරීන් එම නිලධාරීන්ගේ නම්වලට ඉදිරියෙන් ඇති දින සිට රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ රෙජිස්ට්‍රාර් සේවයේ III වැනි ශ්‍රේණියේ රෙජිස්ට්‍රාර්වරුන් ලෙස රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් සතුටින් පත් කර ඇත.

සී. එච්. ගුණවර්ධන මහතා—1962. 3. 1 දින සිට

එම්. ජේ. එන්. පෙරේරා මහතා—1962. 3. 23 දින සිට

ඒ. එම්. එස්. පෙරේරා,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය,
කොළඹ 1,
1962, අප්‍රේල් 26.

5-72

---

## ආණ්ඩුවේ නිවේදන

අංකය: 543 ඊ./173 ඞී.

එල්. ඞී-බී 32/61

**1961 අංක 70 දරන අනිවාර්ය රාජ්‍ය සේවා පනත**

**7 වෙනි වගන්තිය යටතේ ආඥාව**

1961 අංක 70 දරන අනිවාර්ය රාජ්‍ය සේවා පනතෙහි 7 වෙනි වගන්තිය යටතේ මුදල් ඇමතිවරයා විසින් පනවනු ලැබූ ආඥාව.

ෆීලික්ස් ආර්. ඞී. බණ්ඩාරනායක,
මුදල් ඇමති.

1962 අප්‍රේල් 26,
කොළඹ දී ය.

ආඥාව

1961 අංක 70 දරණ අනිවාර්ය රාජ්‍ය සේවා පනතෙහි 3(2) වෙනි වගන්තියේ කාර්යය සඳහා ලංකා විශ්ව විද්‍යාලයේ හෝ ලංකාවෙහි පිහිටුවන ලද ආඥාවෙන් ආධාර මුදලක් ලබන අන්කිසි විශ්ව විද්‍යාලයක වෛද්‍ය උපාධිධරයකු බවට පත්වන තැනැත්තකු සම්බන්ධයෙන් නියමිත කාල සීමාව දෙමසක් විය යුතු යි.

5-230

---

**බන්ධනාගාර ආඥාපනත**

වර්ෂ 1939 අංක 53 දරණ ආඥාපණතින් සංශෝධනය කොට වර්ෂ 1947 සැප්තැම්බර් 24 වැනි දින අංක 9,773 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ප්‍රකාශනයෙන් වෙනස් කර ඇති (44 වැනි පරිච්ඡේදය වන) බන්ධනාගාර ආඥාපණතේ 32(1) (ආ) දරණ වගන්තියේ ප්‍රකාර, මෙහි උපලේඛනයේ II වැනි තීරයේ සඳහන් තැනැත්තන්, මෙම දැන්වීමේ සඳහන් දින සිට එක් අවුරුදු කාලයකට, උපලේඛනයේ I වැනි තීරයේ සඳහන් ආයතනයේ ප්‍රාදේශීය සෝදිසි කොමිටියේ සාමාජිකයන් වශයෙන්, කර්මාන්ත, සවදේශ හා සංස්කෘතික කටයුතු භාර ගරු ඇමතිවරයා විසින් පත් කොට තිබේ.

ඒ. අයි. මොහිදීන්,
කර්මාන්ත, සවදේශ හා සංස්කෘතික කටයුතු භාර අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙනුවටය.

1962 අප්‍රේල් මස 27 වැනි දින,
කොළඹ 7,
කර්මාන්ත, සවදේශ හා සංස්කෘතික භාර අමාත්‍යාංශය.

උපලේඛනය

| I | II |
|---|---|
| මහර බන්ධනාගාරය | කේ. ඞී. ජේ. සිරිවර්ධන මහතා |

5-115

---

1947 සැප්තැම්බර් මස 24 වෙනි දින අංක 9,773 දරණ අති විශේෂ ගැසට් නිවේදනයෙහි ප්‍රසිද්ධ කරන ලද ප්‍රකාශනයෙන් සංශෝධිත වෛද්‍ය ආඥා පනතේ (105 වන අධිකාරිය) 12 (1) (එෆ්) වගන්තිය යටතේ වෛද්‍ය වී. ටී. එච්. ගුණරත්න මහතා අද දින සිට ලංකා වෛද්‍ය සභාවේ සාමාජිකයෙකු වශයෙන් නම් කිරීමට ගරු සෞඛ්‍ය ඇමතිතුමා සතුටු වී සිටියි.

එල්. එස්. බී. පෙරේරා,
ස්ථිර ලේකම්.

1962 අප්‍රේල් මස 23 වෙනි දින,
කොළඹ, සෞඛ්‍ය අමාත්‍යාංශයේ දී ය.

5-2

---

1947 සැප්තැම්බර් මස 24 වෙනි දින අංක 9,773 දරණ අති විශේෂ ගැසට් නිවේදනයෙහි ප්‍රසිද්ධ කරන ලද ප්‍රකාශනයෙන් සංශෝධිත වෛද්‍ය ආඥා පනතේ (105 වන අධිකාරිය) 12 (1) (එෆ්) වගන්තිය යටතේ වෛද්‍ය ආර්. පී. විජේරත්න මහතා 1962 මැයි මස 19 වෙනි දින සිට ලංකා වෛද්‍ය සභාවේ සාමාජිකයෙකු වශයෙන් නම් කිරීමට ගරු සෞඛ්‍ය ඇමතිතුමා සතුටු වී සිටියි.

එල්. එස්. බී. පෙරේරා,
ස්ථිර ලේකම්.

1962 අප්‍රේල් මස 23 වෙනි දින,
කොළඹ, සෞඛ්‍ය අමාත්‍යාංශයේ දී ය.

5-14

---

**1952 කේ. අංක 12 දරණ සෞඛ්‍ය සේවා පණත**

**කුරුණෑගල ආරෝග්‍යශාලා මණ්ඩලය**

1952 කේ අංක 12 දරණ සෞඛ්‍ය සේවා පණතෙහි 11 වෙනි වගන්තිය යටතේ 1962 අප්‍රියෙල් මස 18 වෙනි දින පටන් 1962 දෙසැම්බර් මස 31 වෙනි දින දක්වා එම්. ඕ. එම්. තාහීර් මහතා කුරුණෑගල ආරෝග්‍යශාලා මණ්ඩලයේ සාමාජිකයෙකු වශයෙන් ගරු සෞඛ්‍ය ඇමතිතුමා විසින් පත් කරනු ලැබූහ.

එල්. එස්. බී. පෙරේරා,
ස්ථිර ලේකම්.

1962 අප්‍රියෙල් මස 18 වෙනි දින,
කොළඹ, සෞඛ්‍ය අමාත්‍යාංශයේදීය.

5-4

## 1950 අංක 29 දරණ මිල පාලන පනත

පහත පෙනෙන උපලේඛනයේ සඳහන් නියෝග මවිසින් අනුමත කරණු ලැබූ බව 1950 අංක 29 දරණ මිළ පාලන පණතේ 4වෙනි වගන්තියේ 7 වෙනි අතුරු වගන්තිය යටතේ මවිසින් මෙයින් දනුම් දෙමි.

ටී. බී. ඉලංගරත්න,
වාණිජ, වෙළඳ, ආහාර හා නැව් කටයුතු පිළිබඳ ඇමති.

1962 අප්‍රියෙල් මස 24 දින,
කොළඹ 2.

### උපලේඛනය

| දිනය | නියෝගය | නියෝගය නිකුත් කරණ ලද ද්‍රව්‍ය | නියෝගය පළ කරණ ලද ගැසට් පත්‍රය |
|---|---|---|---|
| 62. 1. 22 | ... ගාලු දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක... | අතිරේක ආහාර ද්‍රව්‍ය (උම්බලකඩ හෝ බොනිටෝ පිෂ්) | 62. 1.27 වෙනි දින අංක 12,887 |
| 62. 1.22 | ... වවුනියා දිස්ත්‍රික්කයේ සහකාර (මිළ) ආහාර පාලක | අතිරේක ආහාර ද්‍රව්‍ය (සුදු සීනි) ... | 62. 1.27 වෙනි දින අංක 12,887 |
| 62. 2.12 | ... මන්නාරම් දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක | අතිරේක ආහාර ද්‍රව්‍ය ... | 62. 2.17 වෙනි දින අංක 12,935 |
| 62. 2.13 | ... ත්‍රිකුණාමලේ දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක | අතිරේක ආහාර ද්‍රව්‍ය (උම්බලකඩ හෝ බොනිටෝපිෂ්) | එම |
| 62. 2.17 | ... මහනුවර දිස්ත්‍රික්කයේ හා නුවරඑළිය දිස්ත්‍රික්කයේ උඩහේවාහැට කොට්ඨාශයේ නියෝජ්‍ය මිළ (ආහාර) පාලක | කරවල හා වියළි ඉස්සෝ ... | 62. 2.23 වෙනි දින අංක 12,939 |
| 62. 2.17 | ... මහනුවර දිස්ත්‍රික්කයේ හා නුවරඑළිය දිස්ත්‍රික්කයේ උඩහේවාහැට කොට්ඨාශයේ නියෝජ්‍ය මිළ (ආහාර) පාලක | අතිරේක ආහාර ද්‍රව්‍ය ... | එම |
| 62. 2.15 | ... හම්බන්තොට දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක | එම ... | එම |
| 62. 2.14 | ... කුරුණෑගල දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක | කරවල හා වියළි ඉස්සෝ ... | එම |
| 62. 2.20 | ... කුරුණෑගල දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක | අතිරේක ආහාර ද්‍රව්‍ය ... | 62. 2.23 වෙනි දින අංක 12,939 |
| 62. 2.17 | ... කෑගල්ල දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක | කරවල හා වියළි ඉස්සෝ ... | එම |
| 62. 2.17 | ... එම ... | අතිරේක ආහාර ද්‍රව්‍ය ... | එම |
| 62. 2.22 | ... මාතලේ දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක | එම ... | 62. 2.28 වෙනි දින අංක 12,942 |
| 62. 2.23 | ... මඩකලපු දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක | කරවල හා වියළි ඉස්සෝ ... | 62. 2.28 වෙනි දින අංක 12,942 |
| 62. 2.23 | ... එම ... | අතිරේක ආහාර ද්‍රව්‍ය ... | එම |
| 62. 2.22 | ... රත්නපුර දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක | එම ... | එම |
| 62. 2.22 | ... එම ... | අතිරේක ආහාර ද්‍රව්‍ය (සියඹලා) ... | එම |
| 62. 2.22 | ... පුත්තලම් දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක | අතිරේක ආහාර ද්‍රව්‍ය ... | 62. 3. 2 වෙනි දින අංක 12,948 |
| 62. 2.26 | ... ගාලු දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක ... | කරවල හා වියළි ඉස්සෝ ... | එම |
| 62. 2.23 | ... මාතර දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක... | අතිරේක ආහාර ද්‍රව්‍ය ... | එම |
| 62. 2.22 | ... පුත්තලම් දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක | කරවල හා වියළි ඉස්සෝ ... | එම |
| 62. 3. 2 | ... මිළ (ආහාර) පාලක ... | අතිරේක ආහාර ද්‍රව්‍ය ... | එම |
| 62. 2.26 | ... යාපනේ දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක | කරවල හා වියළි ඉස්සෝ ... | එම |
| 62. 2.23 | ... මාතර දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක... | එම ... | එම |

5–91

---

## 1954 අංක 37 දරණ ජාතික නිවාස පනත

**49 ඡෙදය යටතේ සහතිකය**

පළාත් පාලන හා නිවාස පිළිබඳ ඇමතිවර, මහානාම සමරවීර වන මම, 1954 අංක 37 දරණ ජාතික නිවාස පනතේ 49 වන ඡේදය යටතේ මා වෙත පවරා ඇති බලතල උඩ මෙහි පහත සඳහන් උපලේඛනයෙහි විස්තර කර ඇති ඉඩම එම පනතේ 2 වන ඡේදයෙහි අදහසට ඇතුළත් නිවාස අරමුණක් ක්‍රියාත්මක කිරීම සඳහා රජය මගින් අත් කර ගතයුතු බව මෙයින් සහතික කරමි.

මහානාම සමරවීර,
පළාත් පාලන හා නිවාස ඇමතිතුමා.

කොළඹ 2, 62.4.24.

### උපලේඛනය

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, දෙහිගම්පල් කෝරලයේ සහ පහත බුලත් ගම ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයේ අංක 106 දරණ යටියන් තොට ගම්මුලාදෑනි වසමේ පිහිටි නුගේ ගාවවත්ත නමැති ඉඩමෙන් පහත සඳහන් පරිදි මායිම් ඇති අක් කර 5½ක පමණ ප්‍රමාණයක ඉඩම් කොටසක්.

උතුරට: හොරන් දල අස් වැද්දුමගාව හේන; නැගෙනහිරට: යටියන් තොට—පූනගල ප්‍රසිද්ධ පාර; දකුණට: හන් ගර මහ දොල ඇල; බස් නාහිරට: හොරන් දල හේන.

5–117

---

## විවිධ දෙපාර්තමේන්තු දන්වීම්

**කළුතර දිස්ත්‍රික්කයේ, කළුතර-පිටගොන් එළිය පාරේ, අංක 1/4 දරන පාලම**

ඉහත සඳහන් පාලමේ වැඩ දන් අවසන් කර, මාර්ගීය රථ වාහනගමනා ගමනය සඳහා විවෘත කර තිබේ.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ අධ්‍යක්ෂ වෙනුවට.

1962 අප්‍රියෙල් මස 23 වෙනි දින,
කොළඹ,
රජයේ වැඩ කාර්යාලයේ දීය.
5–45

## විශෙෂ නිවේදනයයි

1962 මැයි 18 වෙනි සිකුරාදා සහ 19 වෙනි සෙනසුරාදා ආණ්ඩුවේ නිවාඩු දිනයන් වන බැවින්, 1962 මැයි 17 වැනි දින නිකුත් කරනු ලබන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි ළපකිරීම සඳහා එවන සියළුම දැන්වීම් සහ නිවේදන, 1962 මැයි 12 වැනි සෙනසුරාදා දවල් 12 ට ප්‍රථම ආණ්ඩුවේ මුද්‍රණාලයට ලැබෙන්නට සැලැස්විය යුතු බව කාගේත් දැන ගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1962 මැයි 4 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ.

### දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරනු ලබන ගාස්තු

# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

(සෑම සිකුරාදා දිනයන්හි පළ කරනු ලැබේ)

1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරණු ලබන්නේ ප්‍රසිඬ කරන්නාගේ වගකීම පිටය.

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති තැනට තැපැලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. සතියේ දවස්වල පෙරවරු 9 සිට පස්වරු 4.30 දක්වා ද, සෙනසුරාදා දවස්වල පෙරවරු 9 සිට පස්වරු 1 දක්වාද කාර්යාලයේ කටයුතු කරන කාලය බව සැලකිය යුතුය.

4. සතියේ දවස්වල පස්වරු 3.30ට සහ සෙනසුරාදා දවල් 12ට මුදල් ගණුදෙනු කාලය අවසන් වේ.

5. සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. තැපැලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චැක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දෙස් වලක්වා ගැනීම සඳහා, පළ කරන්ට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි. ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

7. සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් හෝ පළ කරනු නොලබේ.

9. උසාවියේ අණ පණත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන සුප්‍රීම් උසාවියේ පෙරකදෝරු මහතාගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිඬ කරනු නො ලැබේ.

10. දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරණ ගාස්තු මෙසේයි :—

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... | 10 | 0 |
| වැඩිවන සෑම අඟලට හෝ ඉන් කොටසකට ... ... | 5 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... | 60 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... | 120 | 0 |

අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.

11. සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිඬ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. ගැසට් පත්‍රය පළ කරණ දින සිට කාර්යාලය වැඩ කරණ දින හතරකට ප්‍රථම පස්වරු 3.30 ට සියලුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි. (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3.30ට ප්‍රථමයෙන්).

13. දායක ගාස්තු :—

**ආණ්ඩුවේ ගැසට් පත්‍රය—වාර්ෂික**

| | මෙරට | | පිටරට | |
|---|---|---|---|---|
| | රු. | ශ. | රු. | ශ. |
| එක් කොටසක් ... ... .... | 22 | 50 ... | 35 | 50 |
| I වැනි කොටසේ එක ඡෙදයක් ... ... | 12 | 50 ... | 18 | 0 |
| I වැනි කොටසේ ඡෙද දෙකක් ... ... | 20 | 0 ... | 28 | 0 |

වර්ෂය අවසානයේ හෝ අර්ධ වර්ෂයක අවසානයේ නිම වන සේ දායක ගාස්තු භාර ගනුයේ 6 මාසයකට නොඅඩු කාලයකට පමණය.

**තනි පිටපත් සඳහා ගාස්තු—(පිටපත් විකිණීමට තිබේ නම්)**

| | මිල | | තැපැල් ගාස්තු මෙරට | |
|---|---|---|---|---|
| | රු. | ශ. | රු. | ශ. |
| (අ) i. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් සතියක් ඇතුලත දී එක කොටසක් ... | 0 | 25 ... | 0 | 20 |
| ii. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් සතියකට පසු, එක කොටසක් ... | 0 | 50 ... | 0 | 20 |
| (ආ) i. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් සතියක් ඇතුලත දී, 1 වැනි කොටසේ එක් ඡේදයක් ... | 0 | 10 ... | 0 | 15 |
| ii. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් සතියකට පසු I වැනි කොටසේ එක ඡෙදයක් ... ... | 0 | 20 ... | 0 | 15 |

දායක මුදල් භාරගැනීම සහ තනි පිටපත් විකිණීම භාර, කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත මුදල් ලැබෙන්නට සලස්වන්න.

ලංකාවේ වැලවත්තයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි